අතුර සිට කලවැල්ලාව දෙසට යන විට අතුර කඩමණ්ඩිය පසු කොට ටික දුරකින් පෙනෙන දර්ශනීය පූජ්‍යස්ථානය වෙල්ගම පන්සල ය. වෙල් යායකින් සහ රබර් යායකින් වටවුණු උස් කඳු ගැට දූපතක පිහිටි වෙල්ගම පන්සල ශ්‍රී සුභික්ෂාරාමය යනුවෙන් හැඳින්වේ. සිල් සමාදන් වන උපාසක උපාසිකා පිරිස පෝය හතරට ම දැක ගත හැකි මෙහි, මා සඳහන් කරන වකවානුවේ විහාරාධිපති පදවිය දැරුවේ කෙසෙල්හේනාවේ සෝමතිලක ස්වාමිපාදයන් වහන්සේ ය. ඉතාමත් නිවුණු ශාන්ත පෙනුමකින් යුතු, මදහස නිරතුරුව මුව'ග රැඳි උන්වහන්සේ පිළිබඳව සටහනක් තැබීම යුතුකමක් කොට සලකමි. පාසලේ තුනේ හතරේ පන්තිවල සිටින කාලයේ මම සෑම

**වෙල්ගම විහාරස්ථානය ආරම්භ කොට ඇත්තේ කෙසෙල්හේනාවේ සුමනතිස්ස නම් ස්වාමින් වහන්සේ නමක් විසිනි. දොන් ඩේවිඩ් විජේගුණවර්ධන මැතිතුමාගේ සහ ඇතුළත්මුදලි මහා රාළහාමිගේ පූර්ව අනුග්‍රහයෙන් පළාතේ දායක කාරකාදීන්ගේ ද ධන පරිත්‍යාගයෙන් ගොඩ නගා ඇති විහාර මන්දිරය ඉතාමත් දර්ශණීය අයුරින් නිමාකොට ඇති අතර, කතරගම දේවාලය සහ විෂ්ණු දේවාලය ද විහාර මන්දිරය ඇතුළත ම පිහිටුවා ඇත.**




# නිහඬ නිසල යති ගුණ සුවඳ



පසළොස්වක පෝයට ම සිල් සමාදන් වීම පිණිස වෙල්ගම පන්සලට ගියෙමි. කොටපන්විල පදිංචි ව සිටි ලොකු උපාසක මහතා ඇතුළු උපාසක පිරිස සමඟ උදේ පාන්දර පන්සලට ගිය අයුරු සහ එහි දී පුංචි උපාසකයකු ලෙස කටයුතු කළ ආකාරය සදාතනික සිහිවටනයකි. පාන්දර හයවන විට රැස්වන පිරිස අට සිල් හි පිහිටුවන ලොකු හාමුදුරුවෝ ඊළඟට දස සිල් සඳහා සැදී පැහැදී සිටින උපාසක උපාසිකාවන් කිහිප දෙනා දසසිල් සමාදන් කරවති. ප්‍රධාන වශයෙන් ශීල ව්‍යාපාරයේ කටයුතු කරන ලොකු උපාසක මහතා අපට ගාථා කියවා, බණ කියා, භාවනා කරවා එම දවස අර්ථවත් දවසක් කිරීමට උනන්දු වූ ආකාරය අදත් සිහිපත් කරමි. අපේ ඉස්කෝලේ ජිනදාස සිල් ගැනීම සඳහා මාත් සමග ම වෙල්ගම පන්සලට ගිය අයෙකි. අප දෙදෙනා සෑම කාර්යක් ම කළේ එකට ය. අද තිබෙන මහා ධර්ම ශාලාව සහ චෛත්‍යය එවකට තිබුණේ නැත. අඹ සෙවණේ අඹන ලද ඇත් රූප සහිත පැන්තාලිය, පූජාවන් සඳහා මල් පහන් සකසන ස්ථානය, ශංඨාරය සහ බෝධීන් වහන්සේ, බෝ මළුව සහ විහාර ගෙය ඉහළ මිදුලෙහි පැවති අතර සංඝාවාසය සමග එකට ම පැවති බණ මඩුව පහළ මිදුලෙහි තිබිණි.

කෙසෙල්හේනාවේ සෝමතිලක ස්වාමින් වහන්සේගේ උපදෙස්, අනුශාසනා අවවාද මැද අප ද කිසියම් වූ සංවර පිරිසක් බවට පත් වූ බව උන් වහන්සේට ගෞරවයක් ලෙස සඳහන් කළ යුතු ම ය.

වෙල්ගම විහාරස්ථානය ආරම්භ කොට ඇත්තේ කෙසෙල්හේනාවේ සුමනතිස්ස නම් ස්වාමින් වහන්සේ නමක් විසිනි. දොන් ඩේවිඩ් විජේගුණවර්ධන මැතිතුමාගේ සහ ඇතුළත්මුදලි මහා රාළහාමිගේ පූර්ව අනුග්‍රහයෙන් පළාතේ දායක කාරකාදීන්ගේ ද ධන පරිත්‍යාගයෙන් ගොඩ නගා ඇති විහාර මන්දිරය ඉතාමත් දර්ශණීය අයුරින් නිමාකොට ඇති අතර, කතරගම දේවාලය සහ විෂ්ණු දේවාලය ද විහාර මන්දිරය ඇතුළත ම පිහිටුවා ඇත.

කෙසෙල්හේනාවේ සෝමතිලක ස්වාමින් වහන්සේගේ අනුශාසනා පරිදි නව විශාල ධර්ම ශාලාව ගොඩ නැගූ අතර ඒ සඳහා සල්පිල් වෙන්දේසි ආදිය සිදු කර මුදල් ප්‍රතිපාදන සොයා ගත් ආකාරය අපට මතක ය. අපේ සෝමතිලක ලොකු හාමුදුරුවන් ගැන මනා සේ දැන ගන්නට උන්වහන්සේගේ සියවැනි ජන්ම සංවත්සරය සඳහා රාජකීය පණ්ඩිත කෙසෙල්හේනාවේ වජිරඥාණ හිමිපාණන් වහන්සේ විසින් සංස්කරණය කරන ලද "ස්වර්ණ ජයන්තිය" නම් පොත් පිංච තුළ සාම විනිසුරු ඉන්ද්‍රරත්න වඩුගේ මහතා විසින් රචනාකොට ඇති සටහන ම සෑහේ යැයි සිතමි.

"ලොකු හාමුදුරුවෝ වරද්දන්නේ නැතුව උදේ හවස තෙරුවන් වැන්දා. උන් වහන්සේ ළඟ වැරදියි කියලා කිසිවක් දැක්කේ නැහැ. ලන්තෑරුම් එළියෙන් මිරිස් හේන, කටුහේන වැනි ප්‍රදේශවලට රාත්‍රී බණවලට පයින්ම වැඩම කළහ. උන් වහන්සේ හරිම සිල්වන්තයි. අවුරුද්දට වෙසක් එකට වෙල්ගම පන්සලට වැල නොකැඩී ජනතාව ඇදී ආවේ විශේෂයෙන් ම ලොකු හාමුදුරුවන්ට වැඳලා ආශිර්වාද ලබා ගන්නයි. සමහර වෙසක් දිනවල රෑ දොළහ වෙනකනුත් පුටුවේ වැඩ ඉන්නවා. එච්චරටම මිනිස්සු ගැන හිතුවා. ආධාර ඉල්ල ගන්නය කියලා කිසිම ගෙදරකට වැඩම කළේ නැහැ. ආවාසෙ හදන වෙලාවේ බොහෝ අමාරුවෙන් තමයි ආරාධනා ටික කරව ගන්න ගෙවල්වලට වැඩම කරන් ගියේ. මම ලොකු හාමුදුරුවෝ ළඟින් ම සිටිය කෙනා. මට ලොකු හාමුදුරුවෝ හැම දෙයක් ම කියනවා. පෞද්ගලික තොරතුරු පවා මටයි කියන්නේ. දවස් දෙකක් මම පන්සලට නොගියත් හොයලා බලනවා.''

අපේ සෝමතිලක ලොකු හාමුදුරුවන් ගැන වර්තමාන විහාරාධිපති කෙසෙල්හේනාවේ වාචිස්සර ස්වාමීන් වහන්සේ සඳහන් කරන්නේ මෙහෙමයි.

"තනතුරු, වරදාන, වර ප්‍රසාද නිරන්තර ප්‍රීති ඝෝෂා කරමින් ඒවා පසුපස නොගිය අප ගුරු දේවයෝ ලාභය සැම විටම අන්‍යයන්ට ද, පාඩුව නිරන්තරයෙන් තමන්ට ද භාරගෙන කටයුතු කළෝ ය. සැනසිලිදායක ජීවිතයට එය ද මහඟු පිටුවහලක් වන්නට ඇත.''

කෙසෙල්හේනාවේ සෝමතිලක මහා යතිවරයාණන් වහන්සේගේ මුවගෙහි රැව් දුන් පින්පෙත් වැඩීම පිළිබඳ වාක්‍යය අද ද මට හොඳට මතක ය. "මල් පහන් පිදීමෙන් ධර්මශ්‍රවණය කිරීමෙන් ලබා ගත්තා වූ කුසලානිශංසය හේතු කොට ගෙන මෙතැන් පටන් නිවන් දක්නා ජාති දක්වා සතර අපායෙහි නොවැටී මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍ය සම්පත් දිව්‍ය ලෝකයේ දිව්‍ය සම්පත් විඳ කෙළවර උතුම් වූ නිර්වාන සම්පත්තිය අත් කර ගත යුතු " යනුවෙන් වදාළ පරිද්දෙන් ම උන්වහන්සේට උතුම් වූ නිර්වාණ සම්ප්‍රාප්තිය අත්වේවා යි ප්‍රාර්ථනා කරමු.

**මතු සම්බන්ධයි**

## ඇබෑර්තු

### රියැදුරන් අවශ්‍යයි

**Victoria Hire Cab Driver**

**UBER X Commercial Car Driver**

**විමසීම්**

**0422 671 826**